(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 160.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

952/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවකයන්ට සහන මිලට යතුරුපැදි ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ තැපැල්කරුවන්ද යතුරුපැදි ඉල්ලා ඇති බවත්;

(ii) ඔවුන්ට මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට සහන මිලට යතුරුපැදි ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1067/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහව සිට වවුනියාව දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එවකට අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළ බවත්;

(ii) ඒ අනුව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රේල් පීලි සහ පාලම්, කොටස් වශයෙන් ආනයනය කර දෙපාර්තමේන්තුව විසින් හෝ දේශීය කර්මාන්තකරුවන් හරහා එකී දුම්රිය මාර්ගය ඉදිකිරීමට සැලසුම් කර තිබූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව ඉන්දියානු කර්මාන්තකරුවන්ට දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම භාර දීමට තීරණයකර තිබේද;

(ii) එසේ නම්, එම තීරණයට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1170/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 සැප්තැම්බර් සිට 2015 පෙබරවාරි දක්වා කාලයේදී ලංකා සතොස මඟින් ආනයනය කරනු ලැබූ සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iv) ආනයනික සහල් නිෂ්කාශනය කිරීම හා ප්‍රමාද ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුවට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සහල් කිලෝවක ආනයනික මිල සහ විකුණුම් මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒ අනුව ලංකා සතොසට සිදුවූ අලාභය කවරේද;

(vii) මෙම තොගයෙන් විකුණනු ලැබූ සහල් ප්‍රමාණය කොපමණද;

(viii) නරක් වූ සහල් ප්‍රමාණය සහ සහල් සත්ව ආහාර ලෙස විකිණීමට කැබිනට් අනුමතිය ලැබුනු දිනය කවරේද;

(ix) එසේ විකිණූ සහල් ප්‍රමාණය, කිලෝවක විකුණුම් මිල සහ සිදු වූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(x) සත්ව ආහාර ලෙස එම නරක් වූ සහල් මිලදී ගත් ආයතනය සහ ප්‍රමාණය කවරේද;

(xi) සහල් ආනයනයේ සිට විකිණීම දක්වා සමස්ත ක්‍රියාවලිය තුළ ලංකා සතොස වියදම් කළ මුදල, ඉපයූ මුදල හා අලාභය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1237/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා, පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1289/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් නැංවීමෙහිලා අතිශයින්ම තීරණාත්මක වූ අධිවේගී මාර්ග තැනීම, ඉකුත් රජයේ ප්‍රමුඛ සංවර්ධන මූලෝපායක් වූ බවත්;

(ii) ඒ අනුව, ඉදිවෙමින් පවතින මාතර - බෙලිඅත්ත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් මේ වනවිට ඇරඹී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්කරගෙන ඇති බවත්;

(iii) මාතර, තිහගොඩ කොට්ඨාශයේ වන්දි තක්සේරු කිරීමේදී ඉඩම් හිමියන්ට යම් අසාධාරණයක් සිදුවී ඇති බවත්;

(iv) එහිදී අධිවේගී මාර්ගයට යාබදව ඉතිරිවන ඉඩම්වල වටිනාකම, පවතින වටිනාකමට සාපේක්ෂව අඩුවීම තක්සේරු කර නොමැති බවත්;

(v) දේපළ කොටසක් පමණක් පවරා ගැනෙන අවස්ථාවන්හිදී ඉතිරිවන කොටස ආන්තික ඉඩම් බවට පත්වීම සැලකිල්ලට ගෙන නොමැති බවත්;

(vi) කුඹුරු ඉඩම් පවරා ගැනීමේදී ගණනය කරනු ලැබූ, අනාගත වෘත්තීය අහිමිවීම, ගොඩ වගාවන් සඳහා ගණනය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සාමාන්‍ය මහා මාර්ගයක් පුළුල් කිරීමේදී, යාබද ඉඩම්වල වටිනාකම් ඉහළ ගියද, අධිවේගී මාර්ගයන්ට අදාළව එසේ නොවීම පිළිබඳ විශේෂයෙන් සලකා බලන විකල්ප වන්දි තක්සේරු ක්‍රමයක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) ඒ අනුව, තිහගොඩ, කපුදූව ප්‍රදේශයේ දේපළ සහ වගාවන් අහිමිවූවන්ට සහනයක් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1398/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 168 යෝජනාව අනුව, කුරුඳු පුහුණු පාසැල් ව්‍යාප්ත කිරීම සඳහා වෙන් කළ රුපියල් මිලියන 50ක මුදල වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති කුරුඳු පුහුණු පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසැල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(v) 2016 වර්ෂය තුළදී කුරුඳු පුහුණු පාසැල් තුළ පුහුණුව ලැබූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව සහ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1068/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන පණිවුඩකරුවන් ඒකාබද්ධ සේවයට අයත් බවත්;

(ii) පණිවුඩකරුවන් සෘජුව බඳවා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පණිවුඩකරුවන් බඳවා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලැබුනු දිනය කවරේද;

(iii) එකී අවසරය ලබා දුන් ලිපියේ පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පණිවුඩකරුවන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරි (පරිපාලන) ගේ ප්‍රධානත්වයෙන්ද;

(ii) එසේ නම්, එකී සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව වනවිටත් එකී නිලධාරියා වැඩ තහනමට ලක්ව සිටි බව පිළිගන්නේද;

(iii) වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකු සේවයේ යෙදී සිටින්නේ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1238/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1291/’16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දනු ලබන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් කුඹුරු ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා මධ්‍යම රජයට අයත් වාරිමාර්ග නඩත්තුව හෝ ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ මුදල;

(ii) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයට අයත් වාරිමාර්ග නඩත්තුව හෝ ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1435/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර නියමයන්ට අනුකූලවීම සඳහා, ධීවර යාත්‍රාවලට සම්ප්‍රේෂණ උපකරණ (Transponders) සවි කිරීමට රජය විසින් කටයුතු කරන බව, 2016 අයවැය යෝජනා අංක153 හි සඳහන් කළ බව පිළිගන්නේද;

(ii) රජය විසින්, එසේ ලබා දෙන සම්ප්‍රේෂණ උපකරණවල සහ එක් යාත්‍රාවක් සඳහා ලබා දෙන සම්ප්‍රේෂණ උපකරණවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී, රජය විසින් සම්ප්‍රේෂණ උපකරණ ලබාදුන් ධීවර යාත්‍රා හිමියන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1239/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1292/’16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉකුත් රජය අඛණ්ඩව පවත්වාගෙන ගිය වී ගොවීන් සඳහා සහනාධාර ක්‍රමයට පොහොර ලබා දීමේ වැඩසටහන, වත්මන් රජය යටතේත් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, 2013, 2014 සහ 2015 වර්ෂවලදී මාතර දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා රජයේ සහනාධාර මත නිකුත් කර ඇති පොහොර ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව සහ එක් එක් පොහොර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් ප්‍රමාණයන් ගොවිජන සේවා බලප්‍රදේශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජයේ පොහොර සහනාධාරය ලබා ගැනීමට ගොවීන් විසින් සපුරාලිය යුතු නිර්ණායකයන් කවරේද;

(v) 2014, 2015 සහ 2016 වර්ෂයන්හි, මාතර දිස්ත්‍රික්කයේ රජයේ පොහොර සහනාධාරය සඳහා සුදුසුකම් ලැබූ වී ගොවීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 3.00 දක්වා විය යුතු ය. පූ. භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය . අ. භා. 3.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 මැයි මස 03 වැනි බදාදා, 04 වැනි බ්‍රහස්පතින්දා සහ 05 වැනි සිකුරාදා පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනයන් විය යුතු ය.

3\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 මැයි මස 03 වැනි බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2017 මැයි මස 04 වැනි බ්‍රහස්පතින්දා සහ 05 වැනි සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 7.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 7.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 5),— 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2017 මැයි මස 03 වැනි බදාදා අ.භා. 1.00 වනතෙක් කල් තැබිය යුතු ය.

6\.

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ගොඩනැගිලි සේවා ඉංජිනේරු සහ තාක්ෂණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය යටතේ, ස්කාගාර/ගුදම් පාලනය වන නියෝග සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 දෙසැම්බර් 09 දිනැති අංක 1996/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.03.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 991 දරන සුරාබදු නිවේදනය)

*2.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 22(1) වගන්තිය යටතේ, බෝතල් කරන ලද රා සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 දෙසැම්බර් 20 දිනැති අංක 1998/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.03.07 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 993 දරන සුරාබදු නිවේදනය)

*3.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 34(1) වගන්තිය යටතේ තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව (2017) සම්බන්ධයෙන් ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 14 දිනැති අංක 2006/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.03.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනත යටතේ නියෝග,— 2006 අංක 27 දරන ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනතේ 33 වගන්තිය සමඟ කියවිය යුතු, 30 වගන්තිය යටතේ නියමිත ආකාරයේ දුම්කොළ නිෂ්පාදන සෑදීම හෝ අලෙවිය තහනම් කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 සැප්තැම්බර් 01 දිනැති අංක 1982/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 2016 දෙසැම්බර් 15 දිනැති අංක 1997/22 දරන සංශෝධිත අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*7.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— තානාපති වරප්‍රසාද පනත යටතේ නියමය,— 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ 4 වැනි වගන්තිය යටතේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2016 ඔක්තෝබර් 05 දිනැති අංක 1987/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත සහ සමිති ආඥාපනත යටතේ නියෝග,— 2007 අංක 7 දරන සමාගම් පනතේ 477 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 527 වගන්තිය යටතේ සහ 2005 අංක 11 දරන සමිති ආඥාපනත (සංශෝධන) සමඟ කියවිය යුතු (123 අධිකාරය වූ) 1891 අංක 16 දරන සමිති ආඥාපනතේ 19 වගන්තිය යටතේ සමාගම් (ගාස්තු) සහ සමිති (ගාස්තු) සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ඔක්තෝබර් 25 දිනැති අංක 1990/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— සමාගම් පනත යටතේ නියෝග,— 1987 සැප්තැම්බර් 14 දිනැති අංක 471/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සමාගම් (ලේකම්වරයන් පිළිබඳ) නියෝගවල 2(i)(ආ) වගන්තිය 2007 අංක 7 දරන සමාගම් පනතේ 527 වගන්තිය යටතේ සංශෝධනය කරමින් (ix) යනුවෙන් නව උපවගන්තිය ඇතුළත් කර කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 20 දිනැති අංක 1998/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2017.03.24 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

16.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---